පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක-492
ආයතනයේ නම- **කෘෂිකර්ම අංශය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්දයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

**பாராளுமன்ற அமர்வு இல** : 492
**நிறுவனத்தின் பெயர்** - ***விவசாயப் பிரிவு***

**பாராளுமன்றத்தின் அரச கணக்குகள் பற்றிய குழுவினால் சபையில் முன்வைக்கப்பட்ட நிலையியற் கட்டளை 119(4) தொடர்பில் கண்காணிப்பு மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்)..2023(**

Parliamentary Session No. - 492
Name of the Institution - Agriculture Section
-

Presenting observations and actions taken regarding the report submitted to Parliament by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)).2023(

ස්ථාවර නියෝග අංක (4)119ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්මේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම(2023).

**පාර්ලිමේන්තු සැසි අංක - 492**

**ආයතනයේ නම - කෘෂිකර්ම අංශය**

පළමු කොටස : 80.0

| අනු | කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා හා අඩුපාඩු | නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය |
|---|---|---|
| 1. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානිපාඩු පිළිබඳ ලේඛනය වර්තමානයේ නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කර ඇති අතර පෙර පැවති දෝෂයන් නිවැරදි කරමින් පවති. (ඇමුණුම 1) |
| 2. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි | විගණන විමසුම් සඳහා පිළිතුරු අදාළ අංශ හා ආයතන මඟින් ලබා ගැනීමට කල්ගතවීම මත පිළිතුරු පමා වූ අතර එම ගැටළුව මගහරවා ගැනීම සඳහා වැඩපිළිවෙලක් වර්තමානයේ ක්‍රියාත්මක කරන බැවින් ඉදිරියේදී මෙම දුර්වලතාවය මගහරවා ගැනීමට හැකි වේ. (ඇමුණුම 2) |
| 3. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | සියළුම විගණන විමසුම් සඳහා අප්‍රාමදව පිළිතුරු සැපයීමට සියළු නිළධාරීන් දැනුවත් කර ඇත.(ඇමුණුම 2) |
| 4. | 2020.08.28 දිනැති අංක 1/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හා මු.රෙ.756 (6) අනුව 2026/03/31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමුකර ඇත. (ඇමුණුම 3) |
| 5. | සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | අයිතිය තහවුරු කරන ලිපි නොමැති වාහන හඳුනා ගෙන ඇති අතර එම වාහන මෙම අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව එම වාහනවල වර්තමානයේ |

| | | |
|---|---|---|
| | | ලියාපදිංචි අයිතිය ඇති අමාත්‍යාංශ වෙතින් එකඟතාව ලබා ගෙන මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී |
| 6. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | සංචිත වාහන සඳහා ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර ඇත. |
| 7. | වාහනයක් ගර්හිත වී මාස 08කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි | 2023 වර්ෂයේදී අපහරණය කිරීමට සුදුසු වාහන නොමැති බවට එම වර්ෂයේ අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ කමිටුව විසින් තීරණය කර ඇත.<br>කෘෂිකර්ම අංශය හා පශු සම්පත් අංශය යටතේ 2024 වර්ෂයේ හඳුනා ගත් අපහරණය කිරීමට විවෘත මිල ගණන් කැඳවනු ලැබූ වාහන 12 අතුරින් (කෘෂිකර්ම - 07, පශු සම්පත් - 05) වාහන 06ක් පමණක් එම වාහන සඳහා ලංසු ඉදිරිපත් කර තිබූ ගැනුම්කරුවන් විසින් 2025 වර්ෂයේදී මිලදී ගෙන ඇත. ඒ අනුව එම වාහන 06ක් පමණක් විකිණීමට හා ඔවුන් වෙත පැවරීමට කටයුතු කර ඇත.<br><br>2025 වර්ෂයේදී වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 ප්‍රකාරව හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ප්‍රකාරව විවෘත මිල ගණන් කැඳවා අපහරණය කිරීමට හඳුනා ගත් වාහන 22 අතුරින් (කෘෂිකර්ම - 12, පශු සම්පත් - 10) වාහන 16ක පමණක් ප්‍රසම්පාදන තීරණ ප්‍රවාහන අංශය වෙත ලැබී ඇති අතර මේ වන විට එයින් වාහන 05ක් පමණක් අදාළ ගැනුම්කරුවන් විසින් එම වාහන මිලදී ගැනීම සඳහා ලංසු මුදල් අමාත්‍යාංශය වෙත ගෙවා ඇත.<br><br>තවදුරටත් අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම සඳහා 2026 වර්ෂයේ අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ කමිටු පත් කර කටයුතු සිදු කරමින් පවතී |
| 8. | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර ඇත. |

| | | |
|---|---|---|
| 9. | නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත. | අදාළ ඇස්තමේන්තු මත නියමිත කාලපරිච්ඡේදයේ දී ප්‍රමාදයකින් තොරව ප්‍රතිපාදන ලබා දීමට, ඉදිරියේදී කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. |
| 10. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි | 2026.05.22 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ වර්ෂයකට වඩා වැඩි කාලයකට අයත් හිඟ ණය ශේෂ පිළිබඳ විස්තර පහත පරිදි වේ.<br>ඩබ්.ජී.එස්.කේ වීදාගම 128,440.00<br>ඩබ්.ඩී.එන්.ප්‍රනාන්දු 208,300.00<br>එම්.ඒ.ඒ.එස්.මුණසිංහ <u>174,600.00</u><br>**<u>511,340.00</u>**<br><br>➢ සේවය අතහැර ගොස් ඇති ඩබ්.ජී.එස්.කේ.වීදාගමගේ ණය මුදල පියවන ලෙස අදාල ණයකරු හා ඇපකරු ලිපි මගින් දැනුවත් කර ඇත.ලිපි වලට කිසිදු ප්‍රතිචාරයක් නොමැත .නීති අංශයට යොමු කර ඇති අතර ,නීති අංශය මගින් ණය මුදල අයකර ගැනීමට ඉදිරි කටයුතු කරමින් පවතී.<br><br>➢ සේවය අතහැර ගොස් ඇති ඩබ්.ඩී.එන්.ප්‍රනාන්දුගේ ණය මුදල පියවන ලෙස අදාල ණයකරු ලිපි මගින් දැනුවත් කර ඇත.ලිපි වලට කිසිදු ප්‍රතිචාරයක් නොමැත .ප්‍රාදේශීය ලේකම් මගින් මෙම ණයකරුට අදාලව වත්කම් තහවුරුවක් ලබා දෙන ලෙසට ඉල්ලුම් කර ඇති අතර මෙම ණයකරුට කිසිදු නිශ්චල හා චංචල දේපළක් නොමැති බවට වත්කම් තහවුරුවක් ප්‍රාදේශීය ලේකම් මගින් ලබා දී තිබේ .නීතිමය කටයුතු සඳහා නීති අංශයට යොමු කර ඇති අතර එම අංශය මගින් ඉදිරි කටයුතු කරමින් පවතී.<br><br>සේවය අතහැර ගොස් ඇති එම්.ඒ.ඒ.එස්.මුණසිංහගේ ණය මුදල පියවන ලෙස අදාල ණයකරු හා ඇපකරුවන් ලිපි මගින් දැනුවත් කර ඇත.ලිපි වලට කිසිදු ප්‍රතිචාරයක් නොමැත.නීතිමය කටයුතු සඳහා නීති අංශයට යොමු කර ඇති අතර එම අංශය මගින් ඉදිරි කටයුතු |

| | | |
|---|---|---|
| | | කරමින් පවතී. |
| 11. | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ කත්ත්කාර්ය අතුරු අග්‍රිම නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ කත්ත්කාර්ය අතුරු අග්‍රිම නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |

ස්ථාවර නියෝග අංක (4)119ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්මේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම(2023).

පාර්ලිමේන්තු සැසි අංක 492 -
ආයතනයේ නම -කෘෂිකර්ම අංශය
පළමු කොටස : 83.0

| අනු | කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා අඩුපාඩු | නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග /වර්තමාන තත්වය |
|---|---|---|
| 1. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 61% කට වඩා වැඩි මට්ටමක පැවතුණි.<br>I. නමුත්, රාජ්‍ය වියදම් පාලනය කිරීම සමබන්ධ 2022.04.26 දිනැති අංක 03/2022 හා 2023.01.27 දිනැති අංක 01/2023 හා 2023.02.02 දිනැති අංක 02/2023 දරණ ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන අනුව,දේශිය රාජ්‍ය ආයතන වෙත පමණක් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීමට සිදු වීම හා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාමුහික නිලධාරීන් සඳහා සිදු කරන බාහිර යොමුගත පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමු කිරීම සීමා වීම මත දේශිය පුහුණු අවස්ථා ලබා දීම අපේක්ෂික මට්ටමට ලගා වීමට නොහැකි විය.<br>2. තවද, 2025 වර්ෂයේදී සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් |

| | | |
|---|---|---|
| | | 85% වඩා පුහුණු අවස්ථා නිලධාරීන් වෙත ලබා දී ඇති අතර, 2026 වර්ෂයේ නිලධාරින් සඳහා පුහුණුවීම් ආරම්භ කර ඇත |
| 2. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය. | අමාත්‍යාංශයේ සියලු අභ්‍යන්තර විධිවිධාන ශක්තිමත් කර 2026 වර්ෂයේදී පිරිසිදු මතයක් කරා යාමට අදාළ නිළධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| 3. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුනි | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කරමින් පවති. |

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩී. පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

(1)

අතිරේක ලේකම් ( ප්‍රවාහන )

2026.05 23

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව විගණකාධිපති සම්පිණ්ඩිත වාර්තාව**

ඉහත වාර්තාවේ 4.5 ඡේදය යටතේ කෘෂිකර්ම හා පශු සම්පත් අංශයේ හානි හා පාඩු සම්බන්ධයෙන් (අ) සිට (එ) දක්වා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

02. අමාත්‍යාංශයේ ඔබ අංශයට අදාළ වාහන අනතුරු සම්බන්ධ සිද්ධීන් 49ට අදාළව මේ වන විට වර්ෂ 02-11 අතර කාලයක් ගතවී ඇතත්, මු.රෙ.104(4) සහ මු.රෙ.109(1) ප්‍රකාරව කටයුතු කර නොමැති බවට ඉහත විගණන නිරීක්ෂණ වාර්තාවෙන් මා වෙත දන්වා ඇත.

03. අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස ඉහත සිද්ධීන්වලට අදාළව මාගේ නිරීක්ෂණ විගණකාධිපතිවරයාට හා පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

03. එබැවින් මෙම ලිපියේ දින සිට මාස 06 ඇතුලත ඉහත වාහන අනතුරුවලට අදාළ සියළු සිද්ධීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඒ පිළිබඳව ලිඛිත සාක්ෂි සහිතව සවිස්තරාත්මක වාර්තාවක් විගණකාධිපතිවරයාට හා පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මා වෙත යොමු කරන ලෙස දන්වන අතර මෙම කාර්ය සඳහා ලබා දෙන ලද කාලය කිසිදු ලෙසකින් දීර්ඝ නොකරන බව වැඩිදුරටත් දන්වන අතර 4.7(ආ) ඡේදයට අදාළ අංක KW – 8202 දරන වාහනය නියමිත ක්‍රමවේද අනුගමනය කරමින් කඩිනමින් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා සිටිමි.

04. ඔබගේ ඉදිරි කාර්ය සාධන ඇගයීමේදී මේ සම්බන්ධයෙන් ඔබ දක්වන වෘත්තීයභාවය පිළිබඳව මා දැඩි ලෙස සලකා බලන බව වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

පිටපත : - විගණකාධිපති - කරු/ දැ.ගැ.ස.

ඇමුණුම (2)


කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு

**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / **Agriculture Division**

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

80/5, "கொவிஜன மந்திரய",ராஜமல்வத்தை வீதி,பத்தரமுல்லை, இலங்கை.

80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Road, Battaramulla, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. Agri/Bud-Ass/12/AQ-2025 Financial Accounts Audit

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2026.05

1.අතිරේක ලේකම් (ඉඩම්/ වාරිමාර්ග/ පශු සම්පත්)

2. අතිරේක ලේකම් (පාලන/කෘෂි සංවර්ධන/ කෘෂි තාක්ෂණ/සංවර්ධන/ විමර්ශන හා අපනයන කෘෂි කර්ම/ පොහොර හා ගොවිජන සේවා/ පොහොර සංවර්ධන)

3.අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම සම්පාදන/ ඉංජිනේරු/ කෘෂි තාක්ෂණ)

4.ප්‍රධාන මූල්‍ය නිලධාරී (ගිණුම් හා ගෙවීම්/ අයවැය හා වත්කම් කළමනාකරණ)

5. නීති නිලධාරී

**<u>අමාත්‍යාංශයේ විෂයන්ට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද කිරීම සම්බන්ධයෙනි.</u>**

ජාතික විගණන කාර්යාලය මගින් අමාත්‍යාංශයේ විෂයන්ට අදාළව ඉදිරිපත්වන විගණන විමසුම් සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ VII වන පරිච්ඡේදයේ 38 (1) (ඉ) වගන්තියේ විධිවිධාන පරිදි දින 07ක් තුළ විගණනකාධිපතිවරයා වෙත මා විසින් පිළිතුරු ඉදිරිපත් කළ යුතුය.

02. විගණන පනතේ එසේ සඳහන් වුව ද, අමාත්‍යාංශයේ විෂයන්ට අදාළව ඉදිරිපත්වන විගණන විමසුම් සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශවලින් නියමිත කාල සීමාව තුළ පිළිතුරු ඉදිරිපත් නොවන බවට මා වෙත තොරතුරු වාර්තා වී ඇත.

03. ජාතික විගණන පනතේ VII වන පරිච්ඡේදයේ 42 වගන්තිය මගින් විගණන විමසුම් සඳහා නියමිත කාල සීමාව තුළ පිළිතුරු ලබා නොදෙන ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස මා හට විගණකාධිපතිවරයා විසින් නඩු පැවරීම මගින් මහේස්ත්‍රාත්වරයෙකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් කළ හැකිය.

04. එබැවින් ඉදිරියේදී විගණන විමසුම් සඳහා නියමිත කාල සීමාව තුළ පිළිතුරු ඉදිරිපත් කරන ලෙස ඔබ වෙත දැඩි ලෙස අවධාරණය කරන අතර ඔබගේ වාර්ෂික වැටුප් වර්ධකය ගෙවීමේදී මා විසින් මේ සම්බන්ධයෙන් දැඩි ලෙස සළකා බලන බව කාරුණිකව දන්වමි.

**ඩී.පී.වික්‍රමසිංහ**

**ලේකම්.**

පිටපත: විගණකාධිපති -කරු. දැ.ගැ.ස.


ලේකම් කාර්යාලය / செயலாளர் அலுவலகம் / Secretary Office — දුරකථන / தொலைபேசி Telephone - 011-2034301; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2863497

පොදු / பொது / General — දුරකථන / தொலைபேசி Telephone - 011-2034300; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2868910


පිළිතුරු ලිපි යොමු කිරීමේදී මගේ අංකය, ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි සඳහන් කර එවීමට කාරුණික වන්න

ඇමුණුම (3)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
# Ministry of Agriculture, Livestock, Lands and Irrigation

කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / **Agriculture Division**


80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ராஜமல்வத்தை வீதி,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Road, Battaramulla, Sri Lanka.


Agri/Acc/07/භාණ්ඩ සමීක්ෂණ

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2025.03 2026/03/31

...ණකාධිපති
...ෂික විගණන කාර්යාලය.

...ෂික භාණ්ඩ සමීක්ෂණය -2025

...ජ මුදල් චක්‍රලේඛ 01/2020 හා මූ.රෙ 756 අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2025 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ ...ක්ෂණ වාර්තාව (භා.ගා.ග.ප.පොදු 66) හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලේඛණ වාර්තාව (පොදු 47) මේ ...ම ඉදිරිපත් කරමි.

...ඕ.නිල්මිණි.
...ම ගණකාධිකාරී
...ය හා වත්කම් කළමනාකරණ

අත්/කලේ:ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්

...ත්.-01.අධ්‍යක්ෂ ජනරාල් -රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
භාණ්ඩාගාරය.

02.ගබඩා භාරකරු

-අ.ක.ස

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு

# Ministry of Agriculture, Livestock, Lands and Irrigation

කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / **Agriculture Division**

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை வீதி,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Road, Battaramulla, Sri Lanka.

මගේ අංකය. / எனது இல. / My No. **Agri/Acc/07/භාණ්ඩ සමීක්ෂණ**

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2025.03 2026/03/31

[redacted]ගණකාධිපති
ජාතික විගණන කාර්යාලය.

<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය -2025</u>

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හා මු.රෙ 756 අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2025 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව (භා.ගා.ග.ප.පොදු 66) හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලේඛණ වාර්තාව (පොදු 47) මේ සමග ඉදිරිපත් කරමි.

[redacted]යි.නිල්මිණි.
ප්‍රධාන ගණකාධිකාරී
අයවැය හා වත්කම් කළමනාකරණ

අත්/කලේ:ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්

පිටපත්.-01.අධ්‍යක්ෂ ජනරාල් -රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
භාණ්ඩාගාරය.

02.ගබඩා භාරකරු -අ.ක.ස

ලේකම් කාර්යාලය / செயலாளர் அலுவலகம் / Secretary's Office — දුරකථන / தொலைபேசி Telephone - 011-2034301; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2863497

පොදු / பொது / General — දුරකථන / தொலைபேசி Telephone - 011-2034300; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2868910